## පසුබිම් කතාව

ඔ

හදිය ඔබටත් ප්‍රශ්නයක් වෙලා ද? ඒක ගණන් ගන්න එපා. එහෙම නොවුණ නම් මිනිස් වර්ගයාගේ පැවැත්මට ලොකු තර්ජනයක් එල්ලවෙන්න ඉඩ තිබුණ. ඩහදිය සුවඳ මිනිස් සතා ගොදුරට ගැනීමට මාන බලාගෙන සිටි සතුනට උහුලාගත නොහැකි අප්‍රිය ගඳක්වීම මිනිසාගේ පැවැත්මට විශාල වාසියක් වුණා.

ඩහදිය ගඳ හෝ සුවඳ ප්‍රශ්නයක් කැරගත යුතු නැති බවත් එය වාසියක් වූ බවත් කියන්නේ සුවඳ විලවුන්වල ඉතිහාසය පිළිබඳ විස්තර කියන "පර්ෆියුම් ක්‍රූ ද ඒජ්ස්" නම් කෘතිය ලියූ රෝසි පේත්ඩර්ස්. ඔහු විවිධ උගතුන් යොදගෙන සමීක්ෂණ ගණනාවක් ම කිරීමෙන් පසු මෙම කෘතිය ලියා ඇති අතර සුවඳ විලවුන් පිළිබඳ රසවත් තොරතුරු රැසක් අනාවරණය කරයි.

ඩහදිය අපේ මුතුන්මිත්තන්ට ජීවත්වීමට උපකාරි වුවක් මෙන් ම එහි සුවඳ අකාමකා දැමීමට පාවිච්චි කළ වෙනත් සුවඳ මුතුන් මිත්තන්ට ආදරය කිරීමට මං පාදා දුන්නේ ය.

පයිප්පයෙන් වහනය වන දුම්කොළ සුවඳ ඇතැම් කාන්තාවන් තුළ කාමුක හැඟීම් ඇවිස්සීමටත්, ආදරය කිරීමට පෙළඹවීමටත් උපකාරී වී ඇති අතර සමන්පිච්ච මල් සුවඳ කාන්තාවන් තුළ කාමෝන්මාදය ඇති කළ හා එසේ කරන උසස් ම සුවඳ වර්ගයකි. මේ හා සමානව ම සඳුන් සුවඳ ද ක්‍රියාත්මක වෙයි.

පෙරදිග ඇතැම් රටවල සුවඳ බුලත් විට ද රාත්‍රී නින්දට පෙර අනිවාර්ය අංගයක් වී තිබූ අතර එය ද සමන්පිච්ච හා සඳුන් සුවඳට කිට්ටු මෙහෙයකට මඟ පාදා දුන්නේ ය.

ප්‍රකට ප්‍රංස නවකතා කරු ගී ද මෝපසාං තම මේසය මත ඊතර් සහ ස්ට්‍රෝබෙරි මිශ්‍රණයක් නිතරම තබා ගත්තේ ය. ඔහු ඒ සුවඳට ප්‍රිය කළේ ය.

ලෝක පූජිත කවියකු වන ගෝතේ වරක් ජර්මන් ජාතික කවියකු වූ ෂිලර් මුණ ගැසීමට ගියේ ය. ෂිලර්ගේ කාමරය කුණු වූ ඇපල් ගඳින් පිරී තිබිණි. ඇපල් තිබුණේ මේස ලාච්චුවක ය. ගෝතේ ඒ ගැන විමසූ විට ෂිලර් මහත්මිය කීවේ තම සැමියාට ඒ ගඳ නැතිව කිසිම සාහිත්‍ය කටයුත්තක් කළ නොහැකි බවයි.

# ගඳ සුවඳ හෙළි කරන රහස්

### දෙල්තොට චන්ද්‍රපාල

*පයිප්පයෙන් වහනය වන දුම්කොළ සුවඳ ඇතැම් කාන්තාවන් තුළ කාමුක හැඟීම් ඇවිස්සීමටත්, ආදරය කිරීමට පෙළඹවීමටත් උපකාරී වී ඇති අතර සමන්පිච්ච මල් සුවඳ කාන්තාවන් තුළ කාමෝන්මාදය ඇති කළ හා එසේ කරන උසස් ම සුවඳ වර්ගයකි. මේ හා සමානව ම සඳුන් සුවඳ ද ක්‍රියාත්මක වෙයි. පෙරදිග ඇතැම් රටවල සුවඳ බුලත් විට ද රාත්‍රී නින්දට පෙර අනිවාර්ය අංගයක් වී තිබූ අතර එය ද සමන්පිච්ච හා සඳුන් සුවඳට කිට්ටු මෙහෙයකට මඟ පාදා දුන්නේ ය.*

සුවඳ විලවුන් සෑදීම පැරණි ඊජිප්තු වැසියන් විසින් අරඹන ලද බවට සාක්ෂි ඇති බව කියන රෝසි පේත්ඩර්ස් 1922 දී තුතන්කාමන් සොහොනට ඇතුළු වූ විට එහි තිබූ මල් බඳුන්වලින් සුවඳ වහනය වූ බව සඳහන් කරයි. ඒවා සුවඳ දියරෙන් පුරවා තබන්නට ඇතැයි විශ්වාස කෙරේ.

රෝමය ගිනි ගනිද්දී වීණා වැයූ බවට ප්‍රකට නීරෝ තම මාළිගයට පර්සියාවෙන් වියළන ලද මල් ගෙන්වාගෙන ඇත. ඒ සඳහා ඔහු රුපියල්වලින් ගණන බැලුවහොත් කෝටි හයකට වැඩි මුදලක් වැය කැර තිබිණි.

නීරෝගේ බිරිය වූ පොප්පියාට රාත්‍රී නෑම සඳහා බූරු දෙනුන් 50 කගේ කිරි යොදගනු ලැබිණ.

ලොව සිටි සුවඳම රජු ලෙස සැලකෙන්නේ ප්‍රංශයේ දහ හතරවැනි ලුවී රජු ය. හේ තම ඇඳුම් සුවඳ දියරේ බහා වියලා නැතිනම් ඇන්දේ නැත. නැපෝලියන් ද තමන්ටම විශේෂිත සුවඳ විලවුන් පාවිච්චි කළේ ය. ඔහුගේ ජොසපින් කස්තුරි සුවඳට ප්‍රිය කළ අතර ඇය සිටි මැල්මෙයිසන් හි කුටිය වසර 170 ක් පමණ ගතවී ඇතත් අදත් කස්තුරි සුවඳ ය.

මෙයට වසර අසූවකට පමණ පෙර එංගලන්තයේ සිටි කඩු නිපදවන්නකු වූ විලියම් යාඩ්ලි ලැවැන්ඩර් යොදගෙන සුවඳ වර්ගයක් නිපදවිය. එම අවස්ථාව ලොව විශාලතම සුවඳ විලවුන් නිපදවන සමාගමක ආරම්භය විය. ලැවැන්ඩර් සුවඳවිලවුන්වල පදනම බවට පත් විය.

රෝමවරු බ්‍රිතාන්‍ය ආක්‍රමණය කරන විට ඉතාලියේ සිට ලැවැන්ඩර් එහි ගෙන ගොස් ඇත.

මධ්‍යතන යුගයේ සුවඳ විලවුන් ඉහළ පැලැන්තියේ අය සඳහා ම නිපදවිණ. තරුණ තරුණියන් මෙන් ම ඔවුන්ගේ සුරතලයට ඇති කළ බල්ලන් බළලුන් වැනි සතුනගේ සිරුරේ ගාන සුවඳ තෙල් වර්ග ද තිබිණි.

අටවැනි හෙන්රි රජු උදයේ ඇගපත සෝදගෙන රෝසතෙල්, කස්තුරි, අම්බර් සහ සීනි සිරුරේ තවරාගෙන ඇත. මෙසේ රජවරුන් සහ ඉහළ පැලැන්තියේ පිරිස් සුවඳ විලවුන් පාවිච්චි කිරීමට පුරුදුව සිටි අතර කරාබු නැටි කුඩු ද ජනප්‍රිය විලවුනක් විය.

සුවඳ විලවුන් තම දන්වීම සඳහා ද යොදගැනීමට බටහිර සමහර සමාගම් පියවරගෙන ඇත. භාණ්ඩවල විස්තර පත්‍රිකාවලට සියුම් කැප්සියුල අලවා තැබීමත්, සමහර පොත්වලට කැප්සියුල අලවා තැබීමත් සිදු කෙරේ. නියපොත්තෙන් මෙම කැප්සියුල සීරුවිට සුවඳ වහනය වේ.

1965 දී ඉලිනොයිස් හි තාක්ෂණික ආයතනය මිනිස් ඩහදිය ගඳ පිළිබඳව ඉතා පුළුල් සමීක්ෂණයක් කළේ ය. සිරුරෙන් වහනය වන සුවඳ පමණක් විශේෂ ක්‍රම යොද එක්රැස් කෙරිණි. එසේ එක් රැස් කළ ඩහදියවල සුවඳ අනුව අයිති අයගේ ස්වභාවය කීමට හැකි බව විද්‍යාඥයෝ සොයාගත්හ.

ඉතා රූමත් තරුණියන්ගේ ඩහදිය අන් හැමගේ ම ඩහදියවලට වඩා ප්‍රියමනාප ගතියකින් යුතු බව ඔවුහු කියති. ❑